ප්‍රායෝගික කෘෂි කර්මය

# ගෝවා වවමු

ගෝවා භෝගය ලංකාවේ වගා කරණ එළවළු අතර, වැදගත් ස්ථානයක් ගනී. මෙරට එළවළු වගා කරණ ගොවීන් අතර, ජනප්‍රිය භෝගයක් මෙන්ම පාරිභෝගික ජනතාව අතර හොඳ ඉල්ලුමක් ඇති භෝගයකි. මෙරට වාසීන් ගෝවා නම්බා ආහාරයට ගැනීම සඳහා හා ව්‍යංජන සෑදීම සඳහා භාවිතා කරනු ලැබේ. ගෝවා ඛනිජ ලවන හා විටමින් හා වලින් පොහොසත්ය.

## වගා කරන ප්‍රදේශයන්

පහතරට වියලි කලාපයේ, මැද රට තෙත් කලාපයේ, උඩරට අතර මැදි කලාපයේ හා උඩරට තෙත් කලාපයේ ගෝවා බහුල වශයෙන් වගා කරනු ලැබේ.

වගා කරන ප්‍රදේශවල නිර්දේශිත ප්‍රභේද:

1. වියලි කලාපය සඳහා

| ප්‍රභේදය | වයස |
|---|---|
| 1. කේ. වයි. දෙමුහුම | 70-80 දින |
| 2. ලංකා ගෝවා | 70 80 දින |
| 3. කේ. කේ. දෙමුහුම | 60-70 දින |

2. උඩරට අතර මැදි කලාපය සඳහා

| | |
|---|---|
| 1. කේ. වයි. දෙමුහුම | 70-80 දින |
| 2. කේ. කේ. දෙමුහුම | 60-70 දින |
| 3. හර්කියුලිස් | 100-120 දින |

3. තෙත් කලාපයේ උඩරට හැර ඉතිරි ප්‍රදේශ සඳහා

| | |
|---|---|
| 1. කේ. වයි. දෙමුහුම | 70-80 දින |

4. උඩරට තෙත් කලාපය සඳහා

| | |
|---|---|
| 1. ඒ, එස්. දෙමුහුම | 100-120 දින |
| 2. එන්. එස්. ,, | 100-120 දින |
| 3. එස්. බී. ,, | 100-120 දින |
| 4. ග්ලෝරියා | 100-120 දින |


## වගා කරන කාලය

විවිධ ප්‍රදේශ වල වගා කරන කීළයන් එකිනෙකට වෙනස් වේ.

කෘෂි කර්ම නිලධාරි
පී. කේ. පී. ආර්. පෙරේරා
විසිනි

පහත දක්වෙන්නේ විවිධ දේශ ගුණික කලාපවල ගෝවා වගා කරන ප්‍රධාන කාල සීමාවන්ය. නමුත් අවාරයන්හි ලැබෙන වැඩි මිල ලබාගැනීම සඳහා අවාරයන්හි ද ගෝවා වගා කිරීමට දූන් දූන් ගොවින් පෙලඹෙන බව පෙනේ.

ගෝවා භෝගය ප්‍රධාන වශයෙන් මහකන්නයේදී සෑම ප්‍රදේශයකම වාගේ විශාල වශයෙන් වගාකරනු ලැබේ. පහතරට වියලි කලාපයේ ඔක්තෝබර් මාසයේ තවාන් දමා නොවැම්බර් මාසයේ ක්ෂේත්‍රයේ සිටවීම කරනු ලැබේ. උඩරට තෙත් කලාපයේ හැර තෙත් කලාපයේ අනිකුත් කොටස් වල ඔක්තෝබර් මාසයේ තවාන් දමා නොවැම්බර් මාසයේ සිටවීම කරයි. උඩරට තෙත් කලාපයේ තවාන්



දැමීම අගෝස්තු මාසයේ සිට ජනවාරි දක්වා සිදුවන අතර, ක්ෂේත්‍රයේ සිටුවීම සැප්තැම්බරයේ සිට පෙබරවාරි දක්වාවූ කාල සීමාවලදී සිදු වේ. උඩරට අතරමැදි කලාපයේ සැප්තැම්බරයේ තවාන් දමා ඔක්තෝබරයේ සිටුවීම සිදු කරයි.

විවිධ දේශගුණික කලාපවල කුඹුරු ඉඩම් හා ජල පහසුකම් ඇති උස් ඉඩම් වල යල් කන්නයේදී ගෝවා වගා කරනු ලැබේ. උඩරට තෙත් කලාපයේ යල් කන්නයේ ගෝවා වගා කිරීම අනිකුත් කලාප වලට වැඩියෙන් සිදුවේ.

## තවාන් පාලනය

1. මීට කලින් ගෝවා කුලයේ (කෘෂිපරේ කුලයේ) භෝග දිගින් දිගට වවා නැති ඉඩම් කොටසක් තවාන් බිම් සඳහා තෝරාගත යුතු වේ. විශේෂයෙන් උඩරට තෙත් කලාපයේ ගෝවා තවාන් සඳහා බිම් තෝරා ගැනීමේදී බරවා රෝග කාරක දිලීරයෙන් තොර පසක් සහිත බිම් කොටසක් තෝරා ගත යුතු වේ.

2. තවාන් බිමේ බිම පෙරලා ගල්කැට රොඩු ආදිය ඉවත් කර ගත යුතු වේ. උඩරට හා මැදරට ආම්ලික පස් ඇති ඉඩම්වල තවාන් දමන විට පස් ආම්ලික තාවය අඩු කිරීමට තවාන් බිමේ මාර්ග මීටර 1 කට හුණුහෝ ඩොලමයිට් ග්‍රෑම් 100 බැගින් බීජ සිටුවීමට දින 14 කට පෙර යොද ගත යුතු වේ.

3. අක්කර එකක තවාන් පැල ලබා ගැනීම සඳහා මීටර් 3 ක් දිග හා මීටර් 1 (එකක්) පලල උස් තවාන් පාත්ති හයක් අවශ්‍ය වේ, උස් තවාන් පාත්ති මීටර් 1 ක් පළල විය යුතු අතර, දිග ඉඩමේ ප්‍රමාණය අනුව තීරණය කර ගත යුතුවේ. සෑම උස් තවාන් පාත්ති දෙකක් අතරම, සෙ: මී: 25 පළල කාණු තිබිය යුතුවේ. තවාන් පාත්තිය උස සෙ: මී: 10 පමණ විය යුතුවේ.

4. හොඳින් තවාන් පාත්ති මට්ටම කර ගත යුතුවේ. ඉන්පසු හොඳින් හලා ගත් කොම්පස්ට් මතුපිට පස් හා කර කරන ලද දහයියා 2:2:1 අනුපාතයෙන් මිශ්‍ර කර මීටර් 3X1 උස් තවාන් පාත්තියකට කූඩ 3 බැගින්, යොද තුනී කර ගත යුතුවේ. මෙවිට උස් තවාන් පාත්ති මත ඉහත මිශ්‍රණයෙන් සැදුනු සෙ: මී: 3 ක් පමණ ඝණකම් ඇති ස්ථරයක් ඇතිවේ.

මෙම ස්ථර නිසා තවානෙන් බීජ පැලවීම අවශ්‍ය තෙතමනය රඳා පැවතීම සිදුවන අතරම බීජ ගැලවීමේදී මුල්වලට සිදුවන හානිසද මෙම මිශ්‍රනය නිසා තරමක අඩු වේ.

5. මිලඟ තවාන් පාත්ති වල සිටිය හැකි රෝග කාරක දිලීර, බැක්ටීරියා හා හානිදයක කෘමීන් විනා කිරම සඳහා තවැන් ජීවානු කරණය සඳහා තවාන් පාත්ති ගිනි තැබීම හා රසායනීක ද්‍රව්‍ය යොද ගැනීම කලහැක. තවාන් පාත්ති ගිණි තැබීම මගින්, ජීවානුකරණය කිරීමේදී පළමුව තවාන් පාත්ති හොඳින් තෙත් කළ යුතුයි. ඉන් පසු සිදුරු හා දහයියා මාරුවෙන් මාරුවට තට්ටු වශයෙන් තවාන් පාත්ති වල ඇතිරිය යුතු වේ. මෙසේ 8'' පමණ උසට තැන්පත් කිරීම සුදුසු වේ. ඉන්පසු වැඩී වේලාවක් ගිණි ගැනීම සඳහා සුළං අතට විරුද්ධ පැත්තෙන් ගිණි තැබිය යුතුවේ. මෙසේ දෙවතාවක් ගිණි තැබීමෙන් බොහෝ දුරට තවාන් ජිවානු කරණය කිරීමට හැකිවේ.

පාංශු දිලීර නාශක යොද ගෙන පසේ ජීවත්වෙන රෝග කාරක පාංශු දිලීර මර්ධනය කිරීම සඳහා මෝරුට හා බ්‍රැසිකෝල් යන දිලීර නාශක දෙක යොද ගත හැක. මෙම දිලීර නාශක දෙකේම පී. සී. එන්. බී. යන කෙටි නමින් හඳුන්වන රසායනික ද්‍රව්‍ය අඩංගුය, නමුත්, බරවා රෝගය අධික උඩරට තවාන් ජිවානුකරණය කිරීමට ගිණි තැබීම හා බ්‍රැසිකෝල් යොද ගැනීම යෝග්‍ය වේ. මෝරුට ග්‍රෑම් 5 ක් ජලය ලීටර් 10 ක දිය කර වර්ග මීටර් එකක තවාන් ප්‍රදේශයකට යෙදිය යුතු වේ. තවාන් බීජ සිටුවීමට දින දෙකකට පෙර මෙසේ යෙදීම කළ යුතුවේ. බ්‍රැසිකෝල් යොද ගැනීමේදී, බ්‍රැසිකෝල් කිලෝ ග්‍රෑම් දෙකක් තවාන් වර්ග මීටර් 100 ක ප්‍රමාණයට යෙදිය යුතුවේ. තවානේ බීජ සිටවීවට දින 7 කට බ්‍රැසිකෝල් යෙදීය යුතු වේ. තවාන් ගිණිතබා නැතිනම් තවානේ ජීවත්වන හානිදයක කෘමීන් මර්දනය සඳහා මෙතමිඩපොස් (වෙළඳ නම ටැමරෝන්) යෙදීම බීජ සිටවීමට පෙර කල යුතුවේ.

6. පාශු ජීවාහරණය කිරීමෙන් පසු තවාන් හොඳින් මට්ටම්කර බීජ සිටුවීමට කටයුතු කල යුතුවේ. පාත්තිවල හරස් අතට එකිනෙකට සෙ: මී: 12.5 දුරින් (අහල් 5 ක) සෙ; මී: 1 ක ගැඹුරක් පේලි බීජ සිටුවීම සඳහා සලකුණු කර ගත යුතුවේ. සලකුණු කරගන්නා පේලිවල ගැඹුර සෙ: මී: 1 කට වඩා වැඩි නොවිය යුත්තේ එවිට බීජ පැල වලට දියමලන් කැවේ රෝගය අධික විය හැකි නිසාය.

7. තවානෙන් පැලවෙන බීජ වලට හානි දයක දිලීර වලින්, සිදු වියහැකි හානි මර්ධනය සඳහා බීජ වලට පූර්ව බීජ ප්‍රතිකාර කරනු ලැබේ. ගෝවා බීජ ග්‍රෑම් 500 කට තේ හැදි එකක ප්‍රමාණයක් කැප්ටාන් මිශ්‍ර කිරීම හෝ තයිරුට (වෙළඳ නම පෝමසාල්) ග්‍රෑම්

දෙකක් ගෝවා බීජ කිලෝ ග්‍රෑම් එකකට මිශ්‍ර කිරීම මගින්, බීජ සඳහා පූර්ව ප්‍රතිකාර කල හැක.

8. සලකුණු කරන ලද පේලි වල පූර්ව ප්‍රතිකාර කරන ලද බීජ දමා තුනී කල පසු ස්ථරයකින් වසා ප්‍රවේශමෙන් තද කල යුතුවේ මෙසේ බීජ තද කිරීම ඒකාකාර ප්‍රරෝහනයක් සඳහා වැදගත් වේ. බීජ ප්‍රරෝහනය වන තෙක් සිදුරු හෝ ගෝනි වලින් තවාන වසා දැමිය යුතුවේ. ඉන්පසු තවාන හොඳින් තෙත්වන තෙක් ගෝනි මතට හෝ සිදුරු මතට මල් බාල්දි යකින් ජලය වත් කල යුතුවේ.

9. වියලි කාලගුණයක් පවතී නම් මුල් දින තුන තුල දිනකට දෙවරක්ද ඉන්පසුව දිනකට වරක්ද ජලය සැපයීම කල යුතුවේ.

10. බීජ පැලවීමත් සමග තවාන වසා ඇති ගෝනි හෝ සිදුරු ඉවත් කළ යුතුවේ, කියත් පනු හානිය හෝ දළඹු හානිය ඇතිවිය හැකි නිසා සුදුසු කෘමිනාශකයක් දින 12 කට වරක් පමණ තවානට යෙදිය යුතුවේ.

දැඩි හිරු රැස් වලින් හා වර්ෂා වෙන් තවාන ආරක්ෂාකර ගැනීම සඳහා තවානට අඩි 2 1/2 පමණ ඉහළින් පොල් අතු හෝ පොලි තීන් වලින්, ආවරණයක් සාදගත යුතුවේ.

12. බීජ එකිනෙකට ඉතා ආසන්නව දමා ඇතිනම් ප්‍රරෝහණ යෙන් දින 10-12 පසුව පැල තුනී කිරීම කල යුතුවේ. මෙය බොහෝ විට කරන්නේ පළමු ශාක පත්‍ර දෙක ඇති වූ විටය. පේලි තුල සෙ: මී: 4—5 පරතරයක් පැල අතර, තිබෙන සේ පැල තුනී කිරීම වැදගත් වේ.

13. සතියකට වතාවක් පමණ තවාන් පාත්තිවල වල් පැල ගලවා තවාන් පැල හා වල් පැල අතර, තරඟකාරි බවක් ඇති වීම වලකා ගත යුතුවේ.

14. ක්ෂේත්‍රයේ සිටුවීමට තවා නෙන් පැල ගැලවීමට දින 10 කට පෙර තවාන් පැල දැඩි කිරීමට පියවර ගතයුතුය. මේ සඳහා ජලය සපයන කාලාන්තරය දීර්ඝ කිරීම හා ක්‍රමයෙන් තවාන වැඩි වේලා වක් හිරු රැස් වලට භාජනය කිරීම වැදගත් වේ.

15. තවානෙන් පැල ගැලවීමට දිනකට පෙර තවාන් පාත්ති හොඳින් තෙත් කල යුතුවේ. මෙ මගින් පැල ගැලවීමේදී තවාන් පැලවල මුල් වලට වන හානිය අඩු කර ගත හ කිවේ.

16. උඩරට ප්‍රදේශවල නම් සිට වීම සඳහා තවාන් පැල ගැලවීම කල යුතු වන්නේ තවානට සති 4 – 5 ත් අතර, කාලයක් ගත වූ විටය. සෙසු ප්‍රදේශ වල සති 3-4 කදී පවින් පැල ගලවා සිටවිය යුතු වේ. මේ අවස්ථාවේ පැලයේ පත්‍ර 4—5 තිබීම වැදගත් වේ.

17. විශේෂයෙන් රෝගී පැල (විශේෂයෙන් මුල් ඉදිමී ඇති බරවා රෝග ලක්ෂණ පෙන්වන පැල) හා දුර්වල පැල සිට වීම සඳහා තෝරා ගත යුතු නැත.

18. තවානේ යම් පැල ප්‍රමාණ යක් පාලු සිටුවීම සඳහාදමු තිරිකර ගත යුතුවේ.

ක්ෂේත්‍රයේ සිටුවීම

ක්ෂේත්‍රයේ පස් සෙ: මී: 20 පමණ ගැඹුරට පෙරලා ගත යුතුවේ. ඉන් පසු හොඳින් කැට පොඩි කර ගත යුතුවේ. ආම්ලික පස් ඇති ප්‍රදේශ වල උදහරණ වශයෙන් උඩරට තෙත් කලාපයේ ගෝවා වගා